සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Christianity
ක්‍රිස්තියානි ධර්මය

Name :- .................................................... Grade : -................ Index number:-....................

### I කොටස

❖ **වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අප ශුද්ධ වූ සහභාගිකමට ඇතුළු විය යුත්තේ
   (i) පුරුද්දක් වශයෙනි
   (ii) දේවස්ථානය තුළ ඉටු කල යුතු චාරිත්‍රයක් ලෙසය
   (iii) පාප ගැන නිසි ලෙස පසුතැවීමෙන් පසුවය
   (iv) ජේසුස්වහන්සේ සිහියට නගා ගැනීමක් ලෙසය.

2. ගෝලන්ගේ පාද සේදීමෙන් ජේසුස්වහන්සේ අපට ඉගැන්වූ පාඩම
   (i) උඩඟු වීම (ii) ස්වාමියෙකු ලෙස ක්‍රියා කිරීම.
   (iii) නිහතමානී බව (iv) උස්පහත්කම් සැලකීම.

3. 'සියල්ල නිම විය' යන කුරුසියේ පැවසූ වදනින් අපට හැඟෙන අදහස
   (i) දෙමාපියන් හොඳින් රැක බලා ගැනීම. (ii) අපට වැරදි කරන අයට කමාව දීම.
   (iii) භාර වූ වැඩය හොඳින් ඉටු කිරීම. (iv) දේව කැමැත්තට යටත් වීම.

4. 'නිවුන් දරුවා' ලෙස හැඳින්වෙන ගෝලයා
   (i) යොහාන් (ii) යාකෝබ් (iii) තෝමස් (iv) පේදුරු

5. පුරාණයේ දී අස්වැන්නේ ප්‍රථම එල පූජා කලේ,
   (i) පාස්කු මංගල්‍යය දිනයේ (ii) පෙන්තකොස්ත මංගල්‍ය දිනයේ
   (iii) අස්වැන්න මංගල්‍යය දිනයේ (iv) නත්තල් දිනයේ ය.

6. ශුද්ධාත්ම බලය ලැබීම තුළින් ගෝලයන් ලැබූ වරමකි.
   (i) ලෙඩුන් සුව කිරීම. (ii) අන්‍ය භාෂා කතා කිරීම.
   (iii) දේශනා කිරීම. (iv) යකුන් දුරු කිරීම.

7. මුල් කිතුනු සභාවේ සුවිශේෂී ලක්ෂණයකි.
   (i) රොටි කැඩීම (ii) ශුද්ධ ලියවිලි ඉගෙනීම
   (iii) යාච්ඤාව (iv) සියල්ල පොදුවේ තබා ගැනීම.

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

8. ස්වාමින් වහනසේගේ යාච්ඤාව තුළ අප ඉටු කළ යුතු යුතුකමකි.
   (i) දවස්පතා භෝජනය ඉල්ලීම.
   (ii) අපගේ වරදට කමා ඉල්ලීම.
   (iii) පරීක්ෂාවට නොපමුනුවන මෙන් ඉල්ලීම.
   (iv) අපට වරද කරන අයට කමාව දෙන මෙන් ඉල්ලීම.

9. දෙවිඳුන් වෙතින් ඈත්ව ක්‍රියා කරනන් ගැන අප ක්‍රියා කල යුත්තේ,
   (i) ඔවුන් නීතිය කරා යොමු කිරීමයි.
   (ii) පව්කරුවන් සේ ප්‍රතික්ෂේප කිරීමයි.
   (iii) සමිඳුන්ගේ කරුණාව ඔවුන් වෙත දැක්වීමයි.
   (iv) ඔවුන් පිළිකුලට භාජනය කිරීමයි.

10. ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේ බව ප්‍රකාශ කල ප්‍රථම ශ්‍රාවකයා
   (i) යොහාන් (ii) තෝමස් (iii) අන්ද්‍රෑ (iv) පේදුරු

11. පෙරමඟ - දූත සේවය ඉටු කළේ,
   (i) ජේසුස්වහන්සේ (ii) දිවැසිවරු
   (iii) පූජකයින් (iv) ස්නාවක ජොහාන්තුමා

12. අන්තිම රාත්‍රි භෝජනයේ දී මිදි යුෂ වලින් ජේසුස්වහන්සේ සංකේතවත් කළේ,
   (i) තම ශරීරය (ii) සහභාගිකම
   (iii) තම ශරීරයෙන් ගැලූ රුධිරය (iv) පූජාව

13. පැරණි ගිවිසුමට අනුව ජුදෙව්වරු පව් කමාව පිණිස
   (i) නිරාහාරව සිටියෝය. (ii) පඬුරු පිදූහ.
   (iii) බෞතිස්මය ලැබූහ. (iv) බැටළු පැටවකු පූජා කලහ.

14. දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය ගැන සඳහන් වන ග්‍රන්ථය
   (i) උප්පත්ති (ii) ගීතාවලිය (iii) ගණන් කථාව (iv) මතෙව්

15. ජේසුස්වහන්සේ ප්‍රේම කල ශ්‍රාවකයා
   (i) පේදුරුය (ii) තෝමස්ය (iii) යාකොබ්ය (iv) ජොහාන්ය

16. අපට පීඩා කරන්නන් උදෙසා අප කල යුත්තේ
   (i) වෛර කිරීමය (ii) ප්‍රේම කිරීමය (iii) යාච්ඤා කිරීමය (iv) සෙත් පැතිමය

17. ගින්න සංකේතවත් කරන්නේ,
   (i) දේව බලයටය (ii) ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයටය.
   (iii) දෙවියන් වහන්සේගේ වැඩ සිටිමටය. (iv) ආරක්ෂාවටය.

18. ජේසුස්වහන්සේ කුරුසියේ පැවසූ මුළු වදන් ගණන
   (i) 4යි (ii) 7යි (iii) 5යි (iv) 3යි

19. ශුද්ධාත්ම ආගමනය සිදු වූයේ,
   (i) පාස්කු දින (ii) පෙන්තකොස්ත දින
   (iii) කුඩාරම් මංගල්‍ය දින (iv) මහා සිකුරාදා දින

20. දෙවියන් වහන්සේ මිනිසා මවා ජීවය දුන්නේ,
   (i) දූවිල්ලෙන්ය (ii) ජීවන හුස්මෙන්ය.(iii) රුධිරයෙන්ය (iv) ජලයෙන්ය

(2 × 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1. (i) අවසාන රාත්‍රි භෝජනයේ දී ජේසුස්වහන්සේ කල ක්‍රියාව කුමක් ද?
   (ii) පෙරමඟ දූතයා ගැන අනාවැකි පැවසූ දිවැසිවරයා කවුද?
   (iii) ජේසුස්වහන්සේ කුරුසියේ දී පැවසූ පළමු වචනය ලියන්න.
   (iv) ජේසුස්වහන්සේ දින 40ක් ගෝලයන් සමග ගත කලේ කුමන සිදුවීමකට පසුවද?
   (v) පෙන්තකොස්ත මංගල්‍ය දින සාමාන්‍යයෙන් සිදුවන්නේ කුමක් ද? මෙය හඳුන්වන නාමය කුමක්ද?
   (vi) සභාව යනු කුමක් ද?
   (vii) 'රන්වත් රිදීවත් මට නැත මට ඇති දේ ඔබට දෙමි' මෙසේ පැවසුවේ කවුරුන් විසින් කා හටද?
   (viii) රන්කාසි දසය පිළිබඳ උපමා කථාවෙන් අපට ඇති පාඩම කුමක් ද?
   (ix) හිස්තැන් පුරවන්න.
   ඔබේ සතුරන්ට ........................................ කරන්න. ඔබට .................................... කරන්න.
   (x) ජේසුස්වහන්සේට පැමිණි පළමු පරීක්ෂාව කුමක් ද?

(ලකුණු 2 × 10 = 20)

2. ''පියාණෙනි මේ කුසලාන මාගෙන් පහ කරන්න''
   (i) මේ වදන් පැවසුවේ කොහේදී ද? (ලකුණු 2)
   (ii) එතන සිටි ගෝලයන් 3 දෙනා නම් කරන්න. (ලකුණු 3)
   (iii) ඔබට වැරදි කරන අය වෙනුවෙන් සමාව ඉල්ලා කරන යාච්ඤාවක් ලියන්න? (ලකුණු 5)

3. මුල් කිතුනු සභාව
   (i) මෙම සභාවට අයත් ගෝලයන් තුල ක්‍රියා කලේ කවුරුන් ද? (ලකුණු 2)
   (ii) මුල් සභාවේ ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 3)
   (iii) මුල් සභාවෙන් අපගේ ජීවිත වලට ඇති ආදර්ශ මොනවා ද? (ලකුණු 5)

4. ජේසුස්වහන්සේ ඉගැන්වීම් කලේ උපමා භාවිතයෙනි.
   (i) නැති වූ බැටළුවාගේ උපමාවේ එන බැටළුවා හා එඬේරා කවුරුන් ද යන්න හඳුන්වන්න. (ලකුණු 2)
   (ii) නැති වූ බැටළුවාගේ උපමාව කෙටියෙන් ලියන්න. (ලකුණු 3)
   (iii) බැටළුවන් ගැන එඬේරුන්ට ඇති වගකීම් 5ක් ලියන්න. (ලකුණු 5)

5. ජේසුස්වහන්සේගේ නැවත නැගිටීම.
   (i) ජේසුස්වහන්සේ නැවත නැගිටි බව විශ්වාස නොකල ගෝලයා කවුද? ඔහුව හඳුන්වන වෙනත් නාමය කුමක් ද? (ලකුණු 2)
   (ii) ඔහු ජේසුස්වහන්සේ නැවත නැගිටි බව විශ්වාස කිරීමට පෙළඹුනේ කෙසේ ද? (ලකුණු 3)
   (iii) අපගේ ජීවිතයේ දීත් ජේසුස්වහන්සේ ජීවමාන බව විශ්වාස නොකරන අවස්ථා 3ක් ලියා උන්වහන්සේ ගැන විශ්වාසය ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග 2ක් ලියන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. ''සමිඳුන්ගේ මාවත පිළියෙළ කරන්න.''

(i) මෙම අනාවැකිය පැවසූවේ කවුරුන් ගැන ද? (ලකුණු 2)

(ii) ඔබ නම් කල පුද්ගලයාගේ ආහාර වස්ත්‍ර හා ජීවත් වූ ආකාරය වෙන වෙනම ලියන්න. (ලකුණු 3)

(iii) ස්නාවක ජොහාන්තුමාගෙන් කිතුනු අප ලබන අවවාද මොනවා ද? ''(ලකුණු 5)